# 21

# කාව්‍ය විචාරය සහ අන්තර්ගතය

*ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පුංචිබණ්ඩා ඒකනායක*

කාව්‍ය විචාර චින්තනය සම්බන්ධයෙන් මෑත කාලයේ දේශීය විද්වතුන් දක්වන උද්‍යෝගය "දේශීය කාව්‍ය විචාර ක්‍රමයක්" ගොඩ නංවා ගැනීමෙහි ලා ඉතා ප්‍රයෝජනවත් වේ.

"කවිය" යනු කුමක් ද? යන ප්‍රශ්නය මෑත කාලයේ අපට පමණක් මතු වූ ප්‍රශ්නයක් නොවේ. කාව්‍යය "උසස්", "වැදගත්", "ශ්‍රේෂ්ඨ" යන විශේෂණ පදවලින් හඳුන්වා දිය යුත්තේ කවර කරුණු පදනම් කොට ගැනීමෙන් ද? කාව්‍යයෙහි අංගෝපංග කවරේ ද? යනාදී ප්‍රශ්න වුව අපට පමණක් සීමා වූ ප්‍රශ්න නොවේ. එහෙත් කාව්‍ය විචාරයක් සඳහා අපට ම ආවේණික වූ නීති රීති පද්ධතියක් හෝ උපදේශ සංග්‍රහයක් හෝ මඟ පෙන්වීමක් හෝ සකස් වී තිබේ ද යන්න මෙරට සාහිත්‍යාභිලාෂීන්ට පමණක් කල්පනා කිරීමට සිදුවී තිබේ. දේශීය වශයෙන් වසර දහසකටත් අධික කාලයක් ඇතුළත ආරක්ෂිත ගද්‍ය පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ හා ලෝක සාහිත්‍ය කෘති ආශ්‍රයෙන් කිසියම් කාව්‍ය විචාර චින්තනයක් ගොඩනඟා ගත හැකි නම් එය සාහිත්‍යාභිලාෂීන්ට පිරිනැමෙන මහඟු දායාදයක් ද වනු ඇත.

භාරතීයයන් කාව්‍යෝපදේශ ග්‍රන්ථ වශයෙන් පිළියෙල කළ කෘතිවල ඇතුළත් කරුණු ද අපරදිගියන් කාව්‍ය, නාටක ආදිය අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් පිළියෙල කළ පොත් පත් ද ඇතැම් විට ග්‍රන්ථ විචාරයේ දී විවිධ අයුරින් භාවිතයට ගත් කරුණු ද සම්බන්ධ කොට ගෙන මිශ්‍ර කාව්‍ය විචාර ක්‍රමයක් මෙරට සාහිත්‍ය විචාරකයන් ගොඩ නගා ගෙන ඇතත් දේශීය කාව්‍ය ග්‍රන්ථ විචාරයට ඒ අදහස් කෙතෙක් දුරට උචිත ද යන්න අවධානයට ගැනුණු බවක් දක්නට නැත. රස, අලංකාර, ධ්වනි ආදී වශයෙන් කාව්‍යයේ ආත්මය සොයා ගිය පෙරදිග කාව්‍යෝපදේශ ග්‍රන්ථ රචකයන් දැක්වූ කරුණු ද සම්භාව්‍ය වාදය, යථාර්ථ වාදය, පශ්චාත් නූතන වාදය ආදී වශයෙන් අපරදිගියන් ප්‍රකාශයට පත් කොට ඇති කාව්‍ය විචාර සංකල්ප ද සම්බන්ධ කොට ගෙන දේශීය සාහිත්‍ය විචාර ක්‍රමයක් ගොඩ නඟා ගැනීමට මෙරට උගතුන් උත්සාහ දරා ඇතත් ඒ සියල්ල අද වන විට විවිධ ආකාරයේ ගැටලු මතු කොට ඇති බවක් මිස සාහිත්‍ය ග්‍රන්ථ විචාරය සම්බන්ධ ගැටලු විසඳා දීමට සමත් වූ ඒවා නොවන බව ඉතා පැහැදිලි ය. මේ නිසා ම එක්තරා වකවානුවක සාහිත්‍ය විචාරකයන් පිරිසක් රසවාදය හෙළා දැක තිබේ. ඊට එරෙහි වූවන් රසවාදය පමණක් නොව අලංකාර,



ධ්වනි ආදී විචාර සංකල්ප යොදා ගෙන ඒවායේ වැදගත්කම ඉස්මතු කොට දක්වා තිබේ. අපරදිග විචාර සංකල්ප කෙරෙහි අවධානය යොමු කළවුන් භාවිත විචාරයෙන් නොනැවතී පශ්චාත් නූතන වාදය පවා සම්බන්ධ කොට ගෙන සිංහල සාහිත්‍ය කෘති විචාරයට ලක් කිරීමට උත්සාහ ගන්නා බව පෙනේ. කාව්‍ය විචාරය සම්බන්ධයෙන් තවමත් දක්නට ලැබෙන මේ ව්‍යාකූලත්වය මඟහරවා ගැනීමට දේශීය කාව්‍ය විචාර චින්තනයක් ගොඩ නංවා ගැනීමේ අවශ්‍යතාව මතු වී තිබේ.

සිංහල සාහිත්‍යයේ දීර්ඝ කාලීන ඉතිහාසය ගැන බලන විට ක්‍රි.ව. 10 වන සිය වස පමණ තුරු කාව්‍ය විචාරය හෝ කාව්‍ය නිර්මාණ කරණය හෝ සම්බන්ධයෙන් විධිමත් නීතිරීති මාලාවක් ප්‍රකාශයට පත් කළ කෘතියක් තිබූ බවට සාධක නැත. ක්‍රි.ව. 8-9 සිය වස් අතරට ගැනෙන සීගිරි ගීය (492)ක් කාව්‍ය විචාරය පිළිබඳ කිසියම් සංකල්පයක් ඉදිරිපත් කොට ඇතත් එය සමස්ත කාව්‍ය නිර්මාණයක් විචාරයට ලක් කිරීමට ප්‍රමාණවත් වූවක් නොවේ. එහි 'හිස් ගී' යන සංකල්පය ප්‍රකාශ වී ඇත්තේ හුදෙක් දේශීය කාව්‍ය විචාර චින්තන රටාවක ප්‍රතිඵලයක් වශයෙන් විය නොහැකි ය. ස්වභාවෝක්ති කථනයක් සේ සැලකිය හැකි කාව්‍ය සංකල්පයක් පිළිබඳ ව විචාරයක් කළ ඒ අවස්ථාව කාව්‍ය විචාරයේ මූලික සටහනක් ලෙස මහාචාර්ය පරණවිතාන ද පිළිගෙන තිබේ. එහි දී මතු වන ගැටලුව නම් ස්වභාවෝක්ති ප්‍රකාශනයක් "හිස් ගී" යන්නෙන් දැක්විය හැකි ද යන්න යි.

කාව්‍ය නිර්මාණයක ගුණ දෝෂ විචාරයට ලක් වූ තවත් කෘතියක් හෝ ඒ වන විට තිබුණේ නම් තත් කාලීන කවියන්ගේ නිර්මාණ අගය කිරීමට පාදක කොට ගත් කරුණු සොයා ගත හැකි වනු ඇත. එහෙත් එවැන්නක් පැරණි යුගයෙන් හමු නොවන නිසා කාව්‍යෝපදේශ ග්‍රන්ථයක් වශයෙන් සැකසුණු "සියබස්ලකර" පමණක් දැනට කාව්‍ය විචාරය සඳහා ද යොදා ගැනේ. එහි දක්වා තිබෙන උපදෙස් ගොඩ නැගී ඇත්තේ දේශීය චින්තනයක ප්‍රතිඵලයක් වශයෙන් ම නොවේ. "ස්වකීය භාෂා අලංකාරය" යනුවෙන් එය හඳුන්වනු ලැබ ඇතත් සංශෝධන කීපයක් හැර ඉතිරි අලංකාර වාදීන්ගේ න්‍යාය පිළිගැනීමක් බව පැහැදිලි ය. වස්තු විෂය සඳහා බුදු සිරිත යොදා ගැනීම, කාව්‍ය රීති (කාව්‍ය මාර්ග) සංකල්පය සුළු වශයෙන් බැහැර කොට තිබීම, එනම්: වෛදර්භී, ගෞඩී ආදී කාව්‍ය රීති සඳහන් කොට නොතිබීම. කාව්‍ය ගුණ අතුරෙන් මටසිලිටු, සමබැවි, සුකුමර යන ගුණත්‍රය බැහැර කොට තිබීම. කාව්‍ය දෝෂ අතුරෙන් විසන්ධික දෝෂ ඉවත් කොට තිබීම සහ අර්ථාලංකාර ප්‍රභේද කිසියම් මඟ පෙන්වීමක් සිදු කොට ඇතත් ඒවා කාව්‍ය විචාර මූලධර්ම පද්ධතියක් ලෙස නම් කළහැකි නොවේ. ඊට හේතුව, සියබස්ලකරෙන් භාරතීය අලංකාර වාදය මෙරට කවියනට භාවිතයට ගත හැකි ක්‍රමයක් පමණක් පැහැදිලි කර දී තිබීමයි.

මහා කාව්‍ය සංකල්පයට අනුව ආශිර්වාද, නමස්කාර, වස්තු නිර්දේශ යන ක්‍රමවලින් ග්‍රන්ථාරම්භය සිදු කළ යුතු බව ප්‍රකාශ වී ඇත. ක්‍රි.ව. 10 වන සිය වසේ රචනා වන්නට ඇතැයි සැලකෙන ධම්පියා අටුවා ගැටපදය සටහන් කළේ 'ගත් වියබ්‍යන් කරන ඇදුරක්හු ගත් පූහායෙහි පළමු තුනුරුවනට නම කර දක්වා' යන්න යි. ඒ අනුව මෙරට ග්‍රන්ථ කරණයෙහි යෙදෙන්නවුන් ග්‍රන්ථාරම්භයේ දී ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීමක් සිදු කළ යුතු බව පැහැදිලි වේ. නිර්විඝ්න පරිසමාප්තිය උදෙසා ඉෂ්ට දේවතා නමස්කාරය කිරීම භාරතීය ලේඛකයන් පවා අනුගමනය කොට ඇත. මෙරට බෞද්ධ සමාජය දේවතා නමස්කාරය බැහැර කොට ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීම සම්මත කොට ගෙන ඇත. මේ ක්‍රමය සන්දේශ කාව්‍ය රචකයන් හා නූතන පද්‍ය කාව්‍ය රචකයන් වැනි ඇතැම් කොටස් ග්‍රන්ථ කරණයේ දී බැහැර කොට ඇතත් බොහෝ ගද්‍ය පද්‍ය කාව්‍ය රචකයන් ත්‍රිවිධ රත්නයට කරන නමස්කාරය අමතක කොට ඇත. මේ කරුණ කාව්‍ය විචාරයකට එතරම් වැදගත් නොවෙතැයි සිතිය හැකි වුවත් තෙරුවන් නැමඳීමේ ක්‍රමය දේශීය ලක්ෂණයක් පිළිබිඹු කරන අවස්ථාවකි. පසු කාලයේ ඇතැම් කවියන් පිතු, පුත්, විදි යන ත්‍රිත්වයට නමස්කාර කිරීම සමග මෙය සසඳා බැලීම සුදුසු ය.

මෙසේ ආරම්භ වන කාව්‍ය නිර්මාණවල කාව්‍ය ආකෘතිය සකස් කර ගැනීම සහ කවි සංකල්පනා සකස් කර ගත යුතු ආකාරය පිළිබඳ ව සියබස්ලකරෙන් උපදෙස් රැසක් ලැබී ඇතත් කාව්‍ය අන්තර්ගතය කවර අරමුණක් පදනම් කොට ගෙන කෙසේ සකස් කර ගත යුතු ද යන්න පිළිබඳව කරුණු සටහන් කොට නැත. 'කවි සිරුරු' යන වචනය එහි සඳහන් කොට ඇත. ඒ සමග 'කැමතිය අත් වදන් පබඳෙහි සිරුරු' යනුවෙන් දක්වමින් ඉෂ්ට වූ අර්ථ ප්‍රකාශ කළා වූ වචන සමූහය කාව්‍යයෙහි ශරීරය බව දක්වා තිබේ. ඒ කාව්‍ය ශරීරය ගද්‍ය, පද්‍ය සහ චම්පූ යන ක්‍රමවලට අනුව සැකසිය හැකි බවත් බුදු සිරිත පද්‍යයටත්, ව්‍රත චාරිත්‍ර ආදිය ගද්‍යයටත් යොදා ගත හැකි බවත් පෙන්වා ඇත. කථා ශරීරය බබුළුවන අර්ථාලංකාර හා ශබ්දාලංකාර ගැන කරුණු කීවත් එහි දී කථා ශරීරය පිළිබඳ ව විස්තරයක් කිරීමට විශේෂ අවධානයක් යොමු කර නැත. බුදු සිරිත යොදා ගන්නා කවියා බුදු සිරිත කෙලෙසෙන ආකාරයේ කථාවක් නොකියනු ඇතැයි සැලකීමෙන් ඒ ගැන විස්තර නොදක්වන්නට ඇතැයි හැඟී ගියත් එවැනි කථා වස්තුවකට ඇතුළත් කළ යුතු හා නොකළ යුතු දේ පිළිබඳව හෝ ලේඛකයාගේ අරමුණ පිළිබඳව හෝ කිසිවක් සටහන් කොට නැත. කාව්‍ය දෝෂ ගැන සඳහන් කරද්දී දේශ, කාල, කලා, ලෝක, න්‍යාය, ආගම යන මේවාට විරුද්ධ කරුණු ඉදිරිපත් නොකළ යුතු බව සටහන් කොට තිබේ. එහෙත් කථා ශරීරයක් පාඨකයාට හෝ ශ්‍රාවකයාට හෝ ඉදිරිපත් කිරීමේ දී එහි අන්තර්ගතයේ ස්වරූපය පිළිබඳ ව සටහනක් කොට නැත. 'අගම් සියෝ



බව' (අග්‍රාම්‍යත්වය) යන්න මාධූර්ය ගුණය යටතේ සඳහන් කොට ඇතත් එය ද කාව්‍ය සංකල්පනාවක් සකස් කර ගැනීමේ දී උපයෝගී කර ගත යුතු කාරණයක් විනා කථා වස්තුව කෙරෙහි බලපාන කරුණක් නොවේ.

කවියා තෝරා ගන්නා කථා වස්තුව ජනතාවට ඉදිරිත් කරන්නක් බැවින් ඒ පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. එය මෙලොව ජීවිතයට හෝ පරලොව ජීවිතයට බලපාන ආකාරයේ වැදගත් කරුණක් විය යුතු ය. එහි දී තෝරා ගැනෙන කථා වස්තුවේ ප්‍රයෝජනවත් භාවය පිළිබඳව යමක් සටහන් වූයේ නම් එය වැදගත් ය. එසේ ම කථා වස්තුවක ප්‍රයෝජනවත් භාවය තීරණය කිරීමට අදාළ කර ගත හැකි කරුණු ද සටහන් කරන ලද්දේ නම් ඉතා වැදගත්ය. මිනිසා මුහුණ පාන හොඳ සහ නරක යන දෙ පක්ෂයම පැහැදිලි කර දීමට කවියෙකුට අයිතිය තිබේ. ඒවා ප්‍රකාශ කෙරෙන ආකාරය අනුව ඉතා වටිනා කථා වස්තුවක් වුවත් අශ්ලීල, නිෂ්ප්‍රයෝජන කථාවක් වන්නට ඉඩ තිබේ. 'සෞන්දරනන්ද' මහා කාව්‍යය රචනා කළ අශ්වඝෝෂ හිමියන් 'ඉත්‍යේෂා ව්‍යුපශාන්තයෙ න රතයෙ" යනුවෙන් සටහන් කළේ කාව්‍ය කරණයේ අරමුණ භාව ප්‍රශමනය විනා භාව ප්‍රකෝපය නොවන බව අඟවමින් කාමය ඉපදවීම සඳහා ඒ මහා කාව්‍යය රචනා නොකළ බව දැක්වීමට ය. කාමය ඉස් මතු කිරීම ලේඛකයෙකුගේ අරමුණක් නොවිය යුතු බව එයින් අවධාරණය කෙරේ. එවැනි ශ්‍රේෂ්ඨ අරමුණක් ඇති ව කාව්‍ය කරණයෙහි යෙදෙන්නෙකුට ඒ අරමුණට පටහැනි කරුණු ඉවත් කොට ඊට උචිත දේ පමණක් තෝරා ගෙන ග්‍රන්ථ කරණයෙහි යෙදිය හැකි ය. "යසෝදරාවත" ලියූ ජන කවියා පවා යශෝධරාගේ රූපලාවණ්‍යය, විවාහ ජීවිතය, දරු සම්පත් ලැබීම වැනි කරුණු අත්‍යුත්කර්ෂවත් ව වර්ණනයට ලක් කළ හැකි වුවත් එසේ නොකොට යශෝධරාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශය පමණක් ලැබෙන පරිද්දෙන් කථා ශරීරය ගොඩ නඟා ගෙන තිබේ. ඔහු කාව්‍ය ගුණ හා රීති, අර්ථාලංකාර හා ශබ්දාලංකාර, මහා කාව්‍ය ලක්ෂණ ආදී කාව්‍ය ආකෘතිය අංග සම්පූර්ණ කිරීමට වඩා අගය කොට ඇත්තේ කථා ශරීරය අර්ථවත් ව ඉදිරිපත් කිරීමට ය. කාව්‍ය නිර්මාණයක ඇති අර්ථවත් බව හෙවත් ප්‍රයෝජනවත් භාවය ඒ ජන කවියා ද අගය කොට ඇත.

බුදුගුණ අලංකාර කවියාට යශෝධරාගේ රූපලාවණ්‍ය විස්තරය පද්‍ය දහසයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබී තිබේ. එතුමා එසේ කෙළේ "බැඳුණහු පෙම් බරින් කෙසේ ගැලවී යෙද්ද සසරින්" යන්න අවධාරණය කරමින් සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණ කාර්යයෙහි ඇති අතිදුෂ්කර භාවය පැහැදිලි කර දීම සඳහා ය. එවැනි ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම නිසා පෘථග්ජන ලෝකයේ වුව ද කාන්තා රූපයට වසඟ වන්නන් එයින් අත මුදවා ගැනීමට කවියාට අවස්ථාව ලැබේ. සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයේ කාන්තා වර්ණනා ඇතත් ඒවා ද කිසියම් ආකාරයකට ඓහලෞකික හෝ පාරලෞකික හෝ ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන්

ඉදිරිපත් කරන ලද ඒවා ය. පූජාවලිය, ථූපවංසය වැනි පොත්වල දක්නට ලැබෙන මරගනුන්ගේ රූපලාවණ්‍ය විස්තරය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ බලය තහවුරු කිරීමට මිස කාන්තා රූ සපුව කෙරෙහි රාගික සංකල්ප ඇති කරවා පාඨකයා හෝ ශ්‍රාවකයා හෝ කාමාග්නියෙන් හළුකර දැමීමට නොවේ. මේ නිසා කාව්‍ය වස්තුව ලෙස යොදා ගන්නා බුදු සිරිත වුව ද විකාශනය කළ යුත්තේ ඖචිත්‍යය පිළිබඳ අවබෝධයකින් යුක්ත ව බව පෙනී යනු ඇත.

කථා වස්තුව රසවත් කිරීමට යැයි සිතමින් ඇතුළු කෙරෙන ඇතැම් වර්ණනාවලින් බුදු සිරිත කෙලෙසා දැමිය හැකි ය. කාව්‍යශේඛරයේ එන ඇතැම් වර්ණනා පිළිබඳ ව විචාරකයන් ප්‍රකාශ කොට ඇති අදහස් අවධානයට ගත් විට පරපුරුෂ සේවනය පිළිබඳ කරුණු ඇතුළත් කිරීමෙන් සත්තුභස්ත්‍රා ජාතක කථාවට ලැබෙන ආලෝකයක් පිළිබඳ ව සැලකිය හැකි නොවේ. වීදාගම මෛත්‍රේය හිමියන් රාජ වර්ණනා, නගර වර්ණනා ආදිය බුදුගුණ අලංකාරයට අතුළත් කොට ඇතත් ඒවා ධාර්මික රාජ්‍ය පාලනයක් නැති අවස්ථාවක ඇති විය හැකි උපද්‍රව පිළිබඳව දැනුම් දී දැහැමි රජයක අවශ්‍යතාව පිළිබඳ හැඟීමක් ඇති කරවීම සඳහා එයට ඇතුළු කොට තිබෙන බව පෙනී යනු ඇත. එසේ ම බුදු සිරිත දක්වද්දී පෙරහැර වැනුම් පවා දක්වා ඇත්තේ පිදිය යුත්තන් පුදන ආකාරය පැහැදිලි කොට බුද්ධ ගෞරවය ඇති කිරීම පිණිස මිස රාගය උත්පාදනය කිරීමට නොවේ. මේ නිසා කවර සාහිත්‍ය නිර්මාණයක් ඉදිරිපත් කරන්නෙකු වුව ද කථා ශරීරය කෙසේ සකසා ගත යුතුද යන්න සහ එහි ප්‍රයෝජනවත් භාවය කුමක් ද යන්න පිළිබඳ ව සලකා බලා කාව්‍ය නිර්මාණය කළ යුතු බව පෙනේ.

කාව්‍ය විෂයයෙහි දී අනුගමනය කෙරෙන කාව්‍ය ආකෘතියට වඩා කථා වස්තුවේ හරය වැදගත් වන බව සලකා මුවදෙව්දා කතුවරයා 'ගුණෙකැත් නම් මෙහි බජවු' යන ප්‍රකාශනය යොදා තිබේ. මෙය දේශීය චින්තනයක වැදගත් ලක්ෂණයක් හෙළි කරන අවස්ථාවකි. කාව්‍ය ග්‍රන්ථයක් පරිශීලනය කළ යුත්තේ එයින් ජනතාවට ලැබෙන යහපත සහ ප්‍රයෝජනය කුමක් ද යන්න සැලකීමෙනි. ප්‍රයෝජනයක් නැති කෘතියක් කියවීම හෝ ඇසීම හෝ නිෂ්ඵල ක්‍රියාවකි. මෙහි සටහන් වන "ගුණ" යන පදය යෙදී ඇත්තේ ආලංකාරිකයන් ප්‍රකාශ කළ "කාව්‍ය ගුණ හෙවත් දශ ප්‍රාණ" අරමුණු කොට ගෙන නොවේ. කථා ශරීරයෙන් ලබා ගත හැකි ජීවිතාවබෝධය, ප්‍රයෝජනවත් භාවය, මනුෂ්‍ය ජීවිතයට එයින් ලබා ගත හැකි යහපත් ප්‍රතිඵලය, ඒ කථාවෙන් ජීවිතයට සම්බන්ධ කර ගත හැකි හරවත් කරුණු යන මේවා 'ගුණ' යන්නෙන් අපේක්ෂා කළ බව පෙනී යයි. ඒ අනුව මෙරට කවියන් විසින් භාරතීය කාව්‍යෝපදේශකයන් 'ගුණ' යන්නෙන් අදහස් කළ කරුණු වලින් බැහැර ව කථා වස්තුවකින් පාඨකයාට හෝ ශ්‍රාවකයාට හෝ ලබා ගත හැකි ප්‍රයෝජනය අගය



කොට තිබීම දේශීය විචාර චින්තනයේ වැදගත් ලක්ෂණයක් බව කිව හැකි ය.

කාව්‍යය සඳහා වස්තු විෂය සපයා ගැනීම සම්බන්ධයෙන් කවියෙකුට නිදහසක් තිබිය යුතු ය. එහෙත් ඒ නිදහස ජනතාවට හානිකර ආකාරයට යොදා ගැනීමට කවියෙකුට අයිතියක් තිබිය නොහැකි ය. කාව්‍ය රචනය ඉදිරිපත් කරන්නේ ජනතාවට බැවින් කවියා නිතර ම පාඨක ශ්‍රාවක දෙපිරිස පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. ඒ නිසා කවියා සතු විශාල වගකීමක් වන්නේ කාව්‍ය නිර්මාණයෙහි ජනතාවට ඇසුරු කිරීමට තරම් ගුණයක් එසේ නොමැති නම් වටිනාකමක් ඇති කාරණයක් කාල දේශ ආදී භේදයකින් තොරව අන්තර්ගත කිරීම යි. මුවදෙව්දා කතුවරයාගේ ප්‍රකාශනයෙහි සැඟවී ඇත්තේ ඒ කාරණය යි.

සසදාවත් කතුවරයා ප්‍රකාශ කෙළේ බුද්ධ ගුණයෙන් එක් අංගයක් මැණික් මල් දමක් මෙන් දැකීමට තමා තුළ තිබූ කැමැත්ත නිසා උගතුන්ගේ සභාවට ඒ කෘතිය ඉදිරිපත් කරන බව යි. එහි දී පාඨකයාට කාව්‍යයෙහි ගුණයක් තිබේ නම් එය පමණක් ගන්නැයි නොකීවත් කථා වස්තුවෙහි ඇති වැදගත්කමක් පිළිබඳව අදහසක් පළ කොට තිබේ. අන්තර්ගත කථා වස්තුව හා ඊට යොදා ගැනෙන කාව්‍යෝපක්‍රම පිළිබඳව අප්‍රසාදය පළ වූ අවස්ථා ද සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවලින් සොයා ගත හැකි ය. රාම සීතා ආදී කථා විතණ්ඩ කථා ලෙස නම් කොට ඒවා සාහිත්‍ය නිර්මාණ උදෙසා යොදා නොගත යුතු බව අවධාරණය කොට තිබේ. අඩුම තරමින් එවැනි කථා ඉගෙන ගන්නා කාලය ඇතුළත දී ශිෂ්‍යයෙකුට වත් නුගැන්විය යුතු කථා ලෙස නම් කොට තිබේ. එසේම පර්වත, ආකාශ, පුර, ස්ත්‍රී ආදී වර්ණනා කාව්‍ය රචනාවලට අන්තර්ගත නොවිය යුතු බවද "දොඩන්නට සුරු වූ" හෙයින් නිසරු කථා දහස් ගණනක් ඉදිරිපත් කළත් ඒවායින් ප්‍රයෝජනයක් නැති බව ද ප්‍රකාශ කොට තිබීමෙන් දේශීය උගතුන් පෙන්වා දී ඇත්තේ වස්තු විෂය හා ආකෘතිය සකස් විය යුත්තේ ජනතාවට ප්‍රයෝජනයක් ගත හැකි ආකාරයෙන් බවයි. අනවශ්‍ය වර්ණනා ලෙස නගර වර්ණනා පවා සලකා තිබෙන බැවින් මහා කාව්‍ය රචකයන් අනුමත කළ උයන් කෙළි, දිය කෙළි, රති කෙළි ආදිය ගැන විශේෂයෙන් සටහන් කිරීම අනවශ්‍ය වේ. සද්ධර්මරත්නාවලී කතුවර ධර්මසේන හිමියන්ට මෙබඳු අදහස් ඉදිරිපත් කිරීමට තරම් පසුබිමක් ඒ වන විට ගද්‍ය පද්‍ය කාව්‍ය රචකයන් නිර්මාණය කොට තුබූ බව සාහිත්‍ය ඉතිහාසය පෙන්නුම් කරයි.

මේ කාල සීමාවේ දීම කව්සිළුමිණ ද රචනා වී ඇති හෙයින් කාව්‍ය නිර්මාණවල අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ ගැටලුවක් මතු වී තිබුණ බව සැලකිය හැකි ය. පොළොන්නරු යුගයේ සිට ගද්‍ය සාහිත්‍යයක් වර්ධනයට පත් වී ඇති බවත් එතැන් සිට වැඩි පුරම ගද්‍ය සාහිත්‍යයේ උන්නතියක් සිදු වී ඇති බවත් කෝට්ටේ යුගය දක්වා ම ගද්‍ය

සාහිත්‍යයේ වර්ධනයක් සිදු වී ඇති බවත් පද්‍යය පසු බා ඇති බවත් මේ කාල සීමාවේ දී දැකිය හැකි ලක්ෂණ කීපයක් වෙයි. ඒ අතර පොලොන්නරු යුගයේ ගද්‍ය කාව්‍ය රචකයන් පවා මහා කාව්‍ය ලක්ෂණ ගද්‍යයට ඇතුළු කිරීමට ප්‍රයත්නයක් දරා ඇති බවද ධර්මප්‍රදීපිකාවේ සුළුකළිඟුදාවතින් පෙනේ. මේ තත්ත්වය යටතේ සාහිත්‍ය නිර්මාණවල අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ කිසියම් විචාරයක් සිදු වී ඇති බව පෙනීයයි. කෝට්ටේ යුගයේ දී පවා මහාකාව්‍ය සම්ප්‍රදය නැවත ඔසවා තැබීමට සිරි රහල් හිමියන් උත්සාහ දරා ඇති නමුත් ගුත්තිල කාව්‍යය, බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව වැනි පද්‍ය කාව්‍ය බිහි වීමෙන් බුදු සිරිතට නොගැළපෙන වැනුම් එකතු කළ අවස්ථා බැහැර වී තිබේ. බුදු සිරිත නො කෙලෙසනු පිණිස සන්දේශ කාව්‍ය ක්‍රමය කරා කවියන් ඇදී යන්නට හේතුවක් වන්නට ඇත්තේ ද මේ කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ ගැටලුව විය හැකි ය. "කිවිසුරු ගුරුළුදැමි මුනුබුරු" යනුවෙන් හැඳින්වෙන මයුර සන්දේශ රචකයාට වුවද කව්සිළුමිණ ඉක්මවා යන පරිද්දෙන් මහා කාව්‍යයක් රචනා කරන්නට තරම් නිර්මාණ ශක්තියක් හා කාව්‍ය සංකල්ප ප්‍රකාශයට පත් කිරීමේ හැකියාවක් තිබූ බව මයුර සන්දේශයෙන් පෙනේ. එහෙත් එවැනි කවියන් මහා කාව්‍ය සම්ප්‍රදාය අනුගමනය කිරීමෙන් ඉවතට ඇදී ගොස් ඇත්තේ ද බුදු සිරිතට නිගා දෙන වැනුම් මගක් අනුගමනය කිරීම මෙරට උගතුන්ගේ මත භේදයට ලක් වූ කාරණයක් වීම නිසා විය හැකි ය. මේ නිසා ම කාව්‍යයේ අන්තර්ගතයෙහි වෙනසක් අපේක්ෂා කළ බව ද සැලකිය හැකි ය.

කාව්‍යයේ අන්තර්ගතය හා එහි ප්‍රයෝජනවත් භාවය නොසලකා කාව්‍ය නිර්මාණ ඉදිරිපත් කළ හැකි වුවත් ඒවා ජනතාවගේ යහපත උදෙසා නොවේ නම් නිෂ්ඵල කාව්‍ය නිර්මාණ ලෙස පිළිගැනීමට සිදු වේ. "දොඩන්නට සුරු වූ හෙයින්" කෙරෙන ග්‍රන්ථ නිර්මාණය නොවැදගත් බව ධර්මසේන හිමියන් පැහැදිලි කළේ ඒ නිසා ය. කව්සිළුමිණ කතුවරයා ද ග්‍රන්ථ ආරම්භයේ දීම අඩු ම තරමින් ත්‍රිවිධ රත්නයට නමස්කාරයක් වත් නොකොට එක් වරම ප්‍රකාශ කොට ඇත්තේ 'තමා වරදස නො දිස්නේ මෙරමා දොස් දිස්නේ' යනුවෙනි. ඉන් පසුව ඔහු ප්‍රකාශ කෙළේ 'පෙදෙහි රස හව් විඳුනා දෙනෙතා ඉතා දුලබෝ' යනුවෙනි. ඒ ප්‍රකාශනය ද එකල පැන නැඟී තිබූ මත වාදයකට පිළිතුරක් බව පැහැදිලි ය. රස භාව අගය කිරීමට යෑම නිසා අන්තර්ගතයට සිදු වන හානිය එක් පක්ෂයක් දැන සිටි අතර අනෙක් පක්ෂය රසභාව අගය කරමින් බුදු සිරිත මහා කාව්‍ය ලක්ෂණවලින් පුරවා තිබූ නිසා මේ මත වාදය ගොඩ නැගෙන්නනට ඇත. තමාගේ අඩුපාඩු නොදැක අනුන්ගේ දොස් දැකීම හෙළා දැක ඇති බැවින් ඇතැම් විට කව්සිළුමිණ කතුවරයාට එකල උගතුන්ගෙන් කිසියම් චෝදනාවක් එල්ල වන්නට ඇති බවද සැලකිය හැකි ය. කාව්‍යයේ අන්තර්ගතය සම්බන්ධයෙන් ධර්මසේන හිමියන් අවධාරණයට ලක් කරන කරුණු කිහිපයක් ඇත.



1. අර්ථාවහ නොවන දෙයින් යුක්ත වූ
2. කාව්‍ය නාටකාදී නිෂ්ප්‍රයෝජන කථා හැර
3. මෙලොවින් ප්‍රයෝජන නැති
4. පුර වර්ණනාදී වූ අර්ථාවහ නොවන
5. නුවණැත්තන් විසින් උගන්නා අවස්ථාවෙහිත් රාම සීතාහරණාදි විතණ්ඩ කථා නූගෙන
6. කිසි කෙනෙකුන්ට කිසිත් ප්‍රයෝජනයක් පරලොවින් නැති
7. යම් බසෙක් නිවන් ප්‍රකාශ නොකොට ආකාශ වර්ණනා ය, පර්වත වර්ණනා ය. වන වර්ණනාය යනාදී නිෂ්ප්‍රයෝජන දෙයින්
8. ස්ත්‍රී වර්ණනාදී අර්ථාවහ නොවන දෙයින්'

මේ ප්‍රකාශන සියල්ලෙන් ම උත්සාහ ගෙන ඇත්තේ කවියනට තමන් යොදා ගන්නා අන්තර්ගත කථා වස්තුව ජනතාවට මෙලොවින් හා පරලොවින් යහපතක් වන එකක් ම විය යුතු බව අවධාරණය කිරීමට ය. කාව්‍යයේ අන්තර්ගතය පිළිබඳ ව මෙතරම් දැඩි ලෙස අවධාරණය කෙරුණු තවත් අවස්ථාවක් දක්නට නැත.

ධර්මසේන හිමියන් කාව්‍යයේ අන්තර්ගතය පිළිබඳ ව මේ තරම් අවධානය යොමු කරන්නට ඇත්තේ පාඨක හා ශ්‍රාවක යන දෙපිරිස පිළිබඳ ව සානුකම්පිත ව බලා ඔවුනට දෙ ලොවින් ම යහපතක් කර දෙනු පිණිස විය යුතු ය. බොහෝ විට නිසරු ප්‍රලාප සේ සැලකිය හැකි කථා වස්තුවලින් ජනතාවගේ සිත් සතන් පිරී යන අවස්ථා උන් වහන්සේ දකින්නට ඇත. එසේ ම ඒ සඳහා උගතුන්ගේ කැප වීම් ද ජනතාවගේ දැඩි යොමු වීම් ද පෙනෙන්නට ඇත. එසේ කාව්‍යය ජනතාවගේ අයහපතට හේතු වන ලෙස වර්ධනය වී ගියහොත් එයින් සිදු විය හැකි අයහපත ද තේරුම් යන්නට ඇත. එවැනි නුවුවමනා කථා නිසා ජනතාවගේ මනසට සිදු වන හානිය මුළු මහත් සමාජයේ ම විනාශයට හේතු වන බව උන් වහන්සේ අනාගත දැක්මක් වශයෙන් දකින්නට ඇත. කෘතියක් කියවන්නා හෝ අසන්නා හෝ එහි ඇතුළත් කරුණුවලින් කිසියම් වෙනසකට පත් කළ හැකිය. කෘතියේ අන්තර්ගතයත් පාඨකයාත් අතර පවතින සම්බන්ධය කුමක් දැයි දෘෂ්ටි ගෝචර නොවූවත් පුද්ගල මනසක් එයින් වෙනස් කළ හැකි ය. ඒ නිසා ලේඛකයා තමන් පාඨකයා අතට පත් කරන්නට යන කරුණ පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කළ යුතු ම ය.

මුවදෙව්දාවත් කතුවරයා කාව්‍යයේ ගුණයක් ඇත්නම් එය පමණක් ගත යුතු බව ප්‍රකාශ කිරීමේ සිට මෙරට බොහෝ කවියන් කාව්‍ය ආකෘතියට වඩා අන්තර්ගතයේ ඇති වටිනාකම ගැන අවධානය යොමු කොට තිබේ. කෝට්ටේ යුගයේ බුදුගුණ අලංකාර කතුවරයා ද "බස දොස ඇතත් එ දමා' යනුවෙන් පවසමින් තම කාව්‍ය නිර්මාණයෙහි භාෂාවෙහි යම් යම් දෝෂ ඇතත් ඒවා අතහැර දමා මුනිගුණය පමණක්

ගන්නැයි ඉල්ලා ඇත. කාව්‍යයෙහි අන්තර්ගතය ජන ජීවිතයට කෙතරම් දුරට සම්බන්ධ වේද යන්න නො සලකා කටයුතු කිරීම නිසා රති කාව්‍ය ආදියෙන් මෙරට සාහිත්‍යය කෙලෙසී ගිය අවස්ථා දැක ගත හැකි ය. නූතන සාහිත්‍යයේ ද ගද්‍ය පද්‍ය නාට්‍ය යන සෑම අංශයක් කෙරෙහිම මේ කරුණ බලපා ඇති බැවින් කාව්‍යයේ අන්තර්ගතය පිළිබඳ ව ලේඛකයන් සැලකිලිමත් වීම උසස් සාහිත්‍යයක් බිහි කර ගැනීම සඳහා ඉමහත් රුකුලක් වනු ඇත.

ඉහත දක්වා තිබෙන කරුණු සැලකිල්ලට ගත් විට කාව්‍ය නිර්මාණයේ දී මෙන් ම කාව්‍ය විචාරයේ දීද කාව්‍ය ආකෘතියට වඩා කාව්‍යයේ අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වන බව අවධාරණය කළ හැකි ය.

**ආශ්‍රේය ග්‍රන්ථ:**


| | |
|---|---|
| කව්සිළුමිණ | වැලිවිටියේ සෝරත නාහිමි (සංස්:) දෙහිවල 1908 |
| කාව්‍ය විචාරය | මාර්ටින් වික්‍රමසිංහ, කොළඹ 1954 |
| කාව්‍යශේඛරය | 'සිරි රහල් පබඳ' අලවු ඉසි සැබිහෙළ (සංස්:) කොළඹ, 1984 |
| ගුත්තිල කාව්‍ය වර්ණනා | ඩබ්.එෆ්. ගුණවර්ධන (සංස්:) කොළඹ 1913 |
| ධම්පියා අටුවා ගැටපදය | ඩී. ඊ. හෙට්ටිආරච්චි (සංස්:) කොළඹ, 1974 |
| ධර්මප්‍රදීපිකාව | බද්දේගම විමලවංශ නාහිමි (සංස්:), කොළඹ, 1967 |
| බුදුගුණ අලංකාරය | නන්දසේන රත්නපාල (සංස්:), කොළඹ |
| මයුර සන්දේශ විවරණය | මුණිදාස කුමාරතුංග (සංස්:), කොළඹ 1963 |
| රතිරත්නාලංකාරය | එස්.එච්. විලියම් ද සිල්වා (සංස්:). මාතර, 1926 |
| සද්ධර්මරත්නාවලිය | කිරිඇල්ලේ ඥාණවිමල හිමි (සංස්:), කොළඹ, 1971 |
| සසදාවත | කේ.ඩී.පී. වික්‍රමසිංහ (සංස්:), කොළඹ, 1961 |
| සියබස්ලකර විස්තර වර්ණනාව, | හේන්පිටගෙදර ඥානසීහ හිමි (සංස්:), කොළඹ, 1964 |
| සීගිරි ගී | නන්දසේන මුදියන්සේ (සංස්:), කොළඹ, 1963 |
| කාව්‍යාදර්ශය | වැලිවිටියේ සෝරත නාහිමි (සංස්:), කොළඹ, 1940 |
| කාව්‍යාලංකාර සූත්‍ර | දූර්ගා ප්‍රසාද සහ කාශිනාථ ශර්ම (සංස්:), බොම්බාය, 1889 |
| නාට්‍ය ශාස්ත්‍රම් | ed.R.S. Nagar, Delhi, 1981 |
| සෞන්දරනන්ද මහා කාව්‍යය | මාතර ශ්‍රී ඥානාරාම හිමි (සංස්:), අලුත්ගම, 1946 |
| Janakiharana | ed.By Paranavitana and Godakumbura, Government press, Ceylon, 1967 |
| Sigiri Graffiti | S. Paranavitana, London, 1956 |


# 22

# භරතමුනි නාට්‍ය ශාස්ත්‍රයේ ශ්‍රී ලාංකේය භාවිතය

*ජෙෂ්ඨ මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ*

**නාට්‍ය ශාස්ත්‍රය** යනු නර්තනය, සංගීතය, නාට්‍යය හා ඊට අනුගත වී ඇති නාට්‍ය ප්‍රභේද, නාට්‍ය උත්පත්ති, ප්‍රේක්ෂාගෘහ, රස, භාව, අභිනය ආදී වූ කරුණු රැසක් ඉදිරිපත් කරන ලද ශාස්ත්‍රීය කෘතියකි. මෙම කෘතිය සම්බන්ධයෙන් අදහස් දක්වන ලද බොහොමයක් දෙනාගේ අදහස වී ඇත්තේ මෙම කෘතිය ක්‍රි.ව. 2-3 වන සියවස්වලට අයත් වන බවයි.[1]

භරතමුනි විසින් ලියන ලදැ යි සැලකෙන මෙම කෘතියෙහි අන්තර්ගතයෙන් හෙළිවන්නේ මහා බ්‍රහ්මයා විසින් **ඉන්ද්‍ර** ප්‍රමුඛ වූ දේව සමූහයාට නාට්‍යයෙහි උත්පත්තිය හා ක්‍රම විධීන් පිළිබඳ ව එකින් එක වෙන් වශයෙන් කරන ලද විග්‍රහයක් බවයි. මෙහි දී දේව සමූහයා විසින් එකින් එක ප්‍රශ්නය බැගින් **මහා බ්‍රහ්මයා** වෙත යොමු කරන ලද අතර ඊට පිළිතුරු වශයෙන් මහා බ්‍රහ්මයා නාට්‍යවේදය විස්තර කර දක්වා ඇත. මෙම කෘතිය මගින් පෙනෙන්නට ඇත්තේ ඊට ආගමික මුහුණුවරක් ලබා දී ආගමික සිද්ධාන්තයක් සේ සලකා ජනතා අවධානයෙහි දීර්ඝ කාලීන ව මෙය පවත්වාගෙන යාමේ අරමුණින් විය හැක. එය භරතමුනිවරයා විසින් තම නිර්මාණයක් වූ **නාට්‍ය ශාස්ත්‍රයට** දේවත්වයක් ආරෝපණය කොට දීර්ඝ කාලයක් තුළ ජනතා භාවිතයෙහි පැවැත්වීමට යොදන ලද කාලීන උපක්‍රමයක් බව පෙනේ.

මෙවැනි උපක්‍රමයකින් හෝ ජනතා භාවිතයෙහි ඉතා සම්භාවනාවට පත් වූ කෘතියක් වන භරතමුනි **නාට්‍ය ශාස්ත්‍රය** මගින් පෙන්නුම් කරන නාට්‍ය සිද්ධාන්ත රැසක් සිංහල නර්තනයෙහි දක්නට ලැබේ. ඒ බැව් ප්‍රථම වතාවට අප විසින් හෙළි කරන ලද්දේ 1995 වසරෙහි **පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය** නම් වූ කෘතියෙන් වන අතර ඉන් අනතුරු ව එකී අදහස් පිළිබඳ ව වෙනත් පර්යේෂකයින්ගේ ද අවධානය යොමු වී ඇති බවක් පෙනෙන්නට ඇත.[2]

නාට්‍ය ශාස්ත්‍රය දෙවියන්ගේ දායාදයක් ලෙස භාවිතයෙහි පවත්වා ගෙන එන්නා සේම නර්තන, වාදන හා ගායන ආදියේ දී පවා මෙවැනි ආගමික මුහුණුවරක් එකී පුරාවෘත්ත මගින් එම ශාස්ත්‍රයන්ට ලබා දී තිබෙන බවක් පෙනෙන්නට ඇත. ඒ ආශ්‍රයෙන් ද අපේක්ෂා කර ඇත්තේ ගෞරව පූර්වක භක්තියක් ඒ ශාස්ත්‍රයන් වෙත ආරෝපණය කර දීර්ඝ කාලයක් සමාජ භාවිතයෙහි ඒවා පවත්වා ගෙන යාමකි.

බෙරයේ උත්පත්තිය පිළිබඳ ව නිර්මාණය වී ඇති බෙර උපත් කව්වල දැක්වෙන්නේ බුදුන් වහන්සේ බුද්ධත්වයට පැමිණි අවස්ථාවේ දී